CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

**2022 මැයි මස 14 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව:** අග්‍රාමාත්‍යවරයා සම්බන්ධයෙන් දේශපාලනික විශ්වසනීයත්වය පිළිබඳව වූ බරපතල විවේචනයන් තිබියදී වුවද, ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපතිවරයා මැතදී අනතුරු හඟවා සිටි බිය එළවන සුලු ආර්ථික තත්වයන්ට රට ඇදවැටීම වැළැක්වීමට වික්‍රමසිංහ මහතාට හැකිවේයයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලාපොරොත්තු සහගතවෙයි. ඒ සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්චාකොට ගිවිසුමකට එළඹීමට හා ඒ දක්වාවන කාලපරිච්චේදය සඳහා තීරණාත්මක වන සහ අපට දැඩි ලෙසම අවශ්‍යව ඇති කෙටිකාලීන අතරමැදි අරමුදල් (Bridging Finance) ලබාගැනීමට ඔහු සමත්විය යුතුය. ශ්‍රී ලාංකික ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් වර්තමානයේ මුහුණපාන මෙතෙක් නොවූවිරූ ආර්ථික දුෂ්කරතාවයන් හමුවේ ශ්‍රීලංකාව පුරා විසිර සිටින අනතුරට පත් ප්‍රජාවන්ගේ අවශ්‍යතාවයන් ඉටුකිරීමට හැකි සම්පූර්ණ වූ සමාජ ආරක්ෂණ ජාලයක් මේ සඳහා බෙහෙවින්ම අවශ්‍යවේ.

ඒ සමගම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි ලෙස අවධාරණයකොට සිටින්නේ ජනතාවගේ ඉල්ලීම් උපරිම වැදගත් කමකින් යුතුවන බවය. ඒවා නොතකා හැරිය නොහැකි වන අතර එසේ කිරීමද නොකලයුත්තක් වෙයි. ජනතා ඉල්ලීම් නොතකා හරින කවර හෝ රජයක් එසේ කරන්නේ තමාටම මෙන්ම රටටද හානි පමුනුවමිනි. එබැවින් අප නව රජයෙන් ඉල්ලා සිටින්නේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ගන්නා කවර හෝ ප්‍රතිකර්මීය පියවරයන් සමග පහත පියවරයන්ද ගතයුතුම වන බවයි:

I. ජනාධිපති ගොටාභය රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීමේ කාලරාමුවක් හඳුනාගතයුතුය.
II. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධන කෙටුම්පත් පනත ඉදිරිපත්කල යුතුය. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. එම්. රන්ජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් පුද්ගලික මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් ලෙස කතානායකවරයාට සහ පාර්ලිමේන්තු මහා ලේකම්වරයාට අප්‍රේල් 21 වන දින ඉදිරිපත් කරනු ලැබූ සහ 2022 මැයි 6 වැනි දින ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ කෙටුම්පත් පනත මගින්, එය නීතියක් ලෙස සම්මත කරනු ලැබූ සැනින්ම විධායක ජනාධිපති ධූරය අහෝසි වනු ඇත.

CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

III. ඉක්මන් මහා මැතිවරණයක් සඳහා දින නියම කළ යුතුය.

IV. හදිසි අවස්ථාව ප්‍රකාශයට පත්කිරීම අවලංගු කල යුතුය.

V. මැයි 9 වැනි දින ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධයෙන් වගවීම සහතික කල යුතුය.

VI. නීතිමය ක්‍රියාමාර්ග හා ප්‍රතිසංස්කරණ ඇතුළුව වංචා දූෂණ මැඩපැවැත්වීම පිනිසවූ පියවරයන් ඇරඹිය යුතුය.

VII. විසම්මුතියට ඇති අයිතිය ඇතුළුව මූලික අයිතිවාසිකම් නගාසිටුවිය යුතුය.